275

RARE

ආර්ථික කරුණු පාදක කොටගත්
සමාජ ප්‍රශ්න පිළිබඳ

# බෞද්ධ විග්‍රහය

ඩී. සෝමරත්න හේවා
(ශාස්ත්‍රවේදී විශේෂ උපාධිය-කොළඹ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය.)
(දර්ශනවේදී ගෞරව උපාධිය-කොළඹ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය.)

ප්‍රවේශ අංකය 275
වර්ග අංකය

දර්ශන විශාරද උපාධිය සඳහා
කැළණිය ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයට
ඉදිරිපත් කරනු ලබන
නිබන්ධයයි.
2001 අප්‍රියෙල්

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය,

# සාරාංශය

නූතන ලෝකයේ මතුවී ඇති බොහෙමයක් සමාජ අර්බුදවලට සම්භාවිත අර්ථක්‍රම මූලික වශයෙන් වගකිව යුතු ආකාරය මෙහි පළමුවන පරිච්ඡේදය තුළින් විස්තර කිරීමට උත්සාහ දරා ඇත. ඒ අනුව විවිධාකාර අර්බුද හා ගැටළු අද සාර්ව භෞමික සමාජ ප්‍රශ්න බවට පත්ව ඇති ලෝක ස්වභාවය කෙබඳුදැයි සරලව පෙන්නුම් කර දීම එහි පළමුවන කොටසෙහි හුවා දක්වා ඇත. අවිචාරාත්මක මිනිසා සම්භාව්‍ය අර්ථක්‍රමවලට වහල්ව, ඒ පසුපස දිගින් දිගටම හඹා යාම තුළින් ඉදිරියට ඇදී ආ එකී අර්ථක්‍රමවල ක්‍රියාකාරීත්වය, පවත්නා සමාජ අර්බුදවලට දැඩි ලෙස තුඩු දුන් ආකාරය පිරික්සීම මෙහි දෙවන හා තුන්වන කොටස්වලින් සිදුකොට ඇත. අද්‍යතන ලෝකයේ ස්වභාවය අනුව සම්ප්‍රදායික අර්ථක්‍රමවලින් බැහැරව, නව අර්ථවත් අර්ථක්‍රමයක අවශ්‍යතාවය මතුවී ඇති බව පෙන්වා දීම මෙහි අවසාන කොටසින් සිදුකොට ඇත.

දෙවන පරිච්ඡේදයේ පළමුවන කොටසින් බුදුදහම තුළ ආර්ථික චින්තාවක් නිර්දේශ වී ඇති බව විස්තර වේ. බෞද්ධ ආර්ථික දර්ශනයේ මූලික පරමාර්ථයන් සලකා බලමින්, එකී පරමාර්ථයන් සාක්ෂාත් කර ගැනීමේ ලා සිදුවන ක්‍රියාකාරීත්වය විමසීම කෙරෙහි එහි දෙවන හා තුන්වන කොටස් කැප කොට ඇත.

මිනිසාට මුහුණ පෑමට සිදුවන විවිධාකාර ගැටළුවල දී කිසියම් වූ අස්වැසිල්ලක් බලාපොරොත්තුවෙන් ඔහු නිසරු සංකල්පයන් වෙත යොමු වීමට පුරුදු වී ඇති බවත්, එහෙත් රජු හෙවත් පාලකයාද, එමෙන්ම රාජ්‍ය තන්ත්‍රයද ඊට වගකිව යුතුව ඇති බවත්, තවද එය බුදුදහමින් අවධාරණ කෙරෙන බෞද්ධ මතය වන ආකාරයත් පැහැදිලි කිරීමට තෙවන පරිච්ඡේදයේ කොටස් කැපවේ. දීඝනිකායට අයත් චක්කවත්ති සීහනාද, කූටදන්ත වැනි සූත්‍ර දේශනා කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එකී කර්තව්‍යය ඉටු කර ඇත.

සමාජ ප්‍රශ්න පිළිබඳව සවිස්තරව සලකා බැලීමක් සිව්වන පරිච්ඡේදයේ පළමුවන,දෙවන සහ තෙවන කොටස්වලින් සිදු කොට ඇත. ඒ අනුව සමාජ ප්‍රශ්නයක ප්‍රභවය, එමෙන්ම එහි ස්වභාවය ගැන විමසා බලමින් ඒ පිළිබඳ බෞද්ධ ආකල්පය කෙබදු දැයි පිරික්සීමටත් මෙහිදී උත්සාහ දරා ඇත. තවද ආර්ථික කරුණු පාදක කර ගනිමින් වත්මන් මිනිසා ඉදිරියේ මූලික සමාජ ප්‍රශ්න මතුවන ආකාරය පිළිබඳ විග්‍රහයක් අන්තර්ගත කරමින්, එසේ මතුවන ප්‍රශ්න අතරින් ප්‍රධාන වූ කිපයක් පමණක්, එනම් පවුල් අවුල්, යුද්ධය හා සාමය, පරිසර දූෂණය, විරැකියාව වැනි ප්‍රශ්නයන් වෙන වෙනවම ගෙන සවිස්තරාත්මක විග්‍රහයකට ලක් කිරීමක් මෙහි සිවුවන කොටසින් සිදුකොට ඇත.

මිනිසා මුහුණ දෙන සියළු සමාජ ප්‍රශ්නවලට විසඳුම් සෙවිය හැකි බවත්, ඒ සඳහා බෞද්ධ ආර්ථික දර්ශනය පිහිට කොට ගැනීමේ වැදගත්කම හා සාධාරනත්වය අවධාරණය කරමින් පස්වන පරිච්ඡේදයේ පළමුවන හා දෙවන කොටස්වලින් නිවැරදි විසඳුම් කරා යායුතු ආකාරය විස්තර කර ඇත. තවද සමාජ ප්‍රශ්නවලට සාර්ථක විසඳුම් සොයා යන

ගමනේ දී ඒ සඳහා රාජ්‍ය ප්‍රතිපත්තිය මෙන්ම පුද්ගල සංවරය ඉමහත් පිටුබලයක් වන ආකාරය මෙහි තෙවන හා සිව්වන කොටස්වලින් ගෙන හැර දැක්වේ. යතාභූතය කෙරෙහි යොමු වෙමින් ඊට අනුරූපව ක්‍රියා කිරීම ප්‍රශ්න නිරාකරණයේ දී සාර්ථකම විසඳුම වන ආකාරය එහි පස්වන කොටසින් පැහැදිලි කෙරේ.

ආර්ථික කරුණු පාදක කොටගත් සමාජ ප්‍රශ්න සමස්ථයක් වශයෙන් ගෙන ඒවා පිළිබඳ බෞද්ධ දෘෂ්ටිය සමාලෝචනයට භාජනය කිරීමත්, එමෙන්ම බුදුදහමින් ගෙන එන විසඳුම සැබවින්ම ප්‍රායෝගික වන බවත්, එහි සත්‍යතාවය ඉක්මවා යන තවත් එවන් වූ විසඳුමක් නොවක බවත්, අවිවාදයෙන් පිළිගත යුතුව ඇති ආකාරය හයවන පරිච්ජේදයෙන් පෙන්වා දී ඇත.